කොළඹ දිසා අධිකරණයේදී ය.

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා ලිමිටඩ්)

නඩු අංකය : 15322/එම් ආර්

හිල්ටන් ස්පෝට්ස් කම්ප්ලෙක්ස්,

ඇට්ලන් චතුරශ්‍රය,

ලෝටස් පාර,

කොළඹ 01.

පැමිණිලිකරු.

- එ දි රි ව -

නිහාල් අමර ශ්‍රී අමරසේකර,

කොම්පිටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්,

167/4, ශ්‍රී විපුලසේන මාවත,

කොළඹ 10.

විත්තිකරු.

XXX --- XXX

නඩු අංකය : 15322/එම්.ආර්.    99.05.21

නි යෝ ග ය.

මෙම නඩුවේ පැමිණිලිකරු විසින් තමුගේ ලේඛණගත නීතිඥ හුසේන් අහමඩ් මහතා මඟින් පැමිණිල්ල මේ අධිකරණයේ ගොනු කොට ඇත.

2/.....

අධිකරණය විසින් එය බාර ගැනීමෙන් අනතුරුව එකී සඳහන් විත්තිකරුට සිතාසි නිකුත් කොට ඇත. ඉන්පසුව විත්තිකරු පෙනී සිටීම ඇතුලත් කොට උත්තර ගොනු කොට ඇත. ඉන්පසුව විත්තිකරු විසින් පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරුන් වෙත විචාරණ ඉදිරිපත් කිරීමට ඉඩ පැතීමෙන් අනතුරුව නඩුව ඉදිරියට යමින් තිබී ඇත. 11.10.96 වෙනි දින මෝෂමක් මගින් පැමිණිල්ලේ ලේඛනගත නීතිඥ යුසේන් අහමඩ් මහතාට දී තිබූ පෙරකලාසිය අවලංගු කරන ලෙසටත්, ටී.ජී.කුමාරපේරු පීරිස් මියට පැමිණිලිකරු විසින් දී ඇති පෙරකලාසියක් ඉදිරිපත් කරමින් එය පැමිණිලිකරු වෙනුවෙන් බාර ගන්නා ලෙසටත් ඉල්ලා ඇත.

මේ ඉල්ලීම කර ඇති බව පෙනී යන්නේ පෙර සඳහන් පැමිණිල්ලේ ලේඛනගත නීතිඥ මහතාට දී ඇති පෙරකලාසිය අවලංගු කරන ලෙසට පැමිණිලිකරු දී ඇතියි කියන ලිපියක් මත එකී නීතිඥ මහතාගේ පෙරකලාසිය අවලංගු කිරීමට එකඟත්වයකින් තොරවය. එම තත්වය යටතේ එකී ඉල්ලීම අධිකරණයේ තහවුරු කරන ලෙසට නියෝගයක් කිරීමට සිදුවී ඇත. ඒ අවස්ථාවේදී ඉදිරිපත් වූ කරුණු අනුව පෙනී ගියේ පැමිණිල්ලේ ලේඛනගත නීතිඥ එම්. අහමඩ් මහතා තවදුරටත් පැමිණිලිකරුගේ ලේඛනගත නීතිඥ ලෙසට සිටින බවත්, පැමිණිලිකාර සමාගමෙන් ඔහුට ලැබී ඇති උපදෙස් අනුව ඔහුට දී තිබූ පෙරකලාසිය පැමිණිලිකාර සමාගම විසින් අවලංගු කර නොමැති බවත්, එසේ අවලංගු කිරීමක් පිළිබඳව වත්මන් ඉල්ලීම කරන ඉල්ලුම්කරු විසින් දක්වා ඇති කරුණු සාවද්‍ය බවයි.

මේ අනුව උද්ගත වී ඇති තත්වයන් නිසා එකිනෙකට පරස්පර විරෝධී තත්වයන් දෙකක් හෙළිදරව් වී ඇත. දෙපාර්ශවය විසින්ම දිවුරුම් පෙත්සම් මගින් ආල කරුණු ඉදිරිපත් කොට ඇත. එමෙන්ම ප්‍රති දිවුරුම් පෙත්සම් ද ගොනුව

3....

ඇත. දැන් අධිකරණය විසින් කිරීමට නියමිත නියෝගය වී ඇත්තේ හුසේන් අහමඩ් මහතාගේ පෙරකලාසිය තවමත් වලංගුව පවතිනවාද එසේ නැත්නම් එය අවලංගු කළයුතුද යන්න පිළිබඳවය.

ගොනුවී ඇති සියලු ලියවිලි හා ලේඛණ ඉදිරිපත් කර ඇති කරුණුත් සලකා බැලීමේදී පෙනී යන්නේ එකී නීතිඥ හුසේන් අහමඩ් මහතා බලයලත් නීතිඥවරයා වශයෙන් මේ නඩුවේ පැමිණිල්ල අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්, එසේ පැමිණිල්ලේ ලේඛණගත නීතිඥවරයා ලෙස වූ පත්වීම වත්මන් ඉල්ලීම 11.10.96 (කා.ය.19) දින කලන පෙත් සමයකින් පොරව පැමිණිලිකරු වෙනුවෙන් ඔහු වලංගු පෙරකලාසියක් දැරූ බවයි.

ඉහත තත්වයන් යටතේ සලකා බැලිය යුතු වන්නේ නීතිඥ එච්.අහමඩ් මහතා දී තිබී ඇති පෙරකලාසිය අවලංගු කර ඇද්ද, එම නීතිඥ මහතා දී තිබූ පෙරකලාසිය මේ නඩුකරය සඳහා තවමත් පැමිණිලිකරු වෙනුවෙන් වලංගුව පවතිනවාද යන්නයි.

MAY 1999

දැනට පැමිණිලිකාර සමාගමේ පෙරකලාසිය අවලංගු කරන ලෙසට ඉල්ලා ඇති ඉල්ලීම රැඳා ඇත්තේ පැමිණිලිකා ර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 28.06.95 වන දින පවත්වා ඇති රැස්වීමේ සටහන් මතය. එයම $X_3$ ලෙසට පැමිණිලිකරුගේ අධ්‍යක්ෂක ඉෂිබාෂි මහාගේ දිවුරුම් පෙත්සම සමඟ ද, X1 ලෙසට පැමිණිලිකාර සමාගමේ ලේකම්වරු වන කෝපරේට් සර්විසස් සමාගමේ

අධ්‍යක්ෂක වරයෙක් වන යූ.එල්.කදුරුගමුව මහතාගේ දිවුරුම් පෙත්සම සමඟ 'එක්ස්1' වලසට අමුණා ඉදිරිපත් කොට ඇත. එමෙන්ම පැමිණිලිකාර සමාගමේ සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂක ලෙසට දිවුරුම් පෙත්සමක් දී ඇති සී.එල්.පෙරේරා මහතාගේ දිවුරුම් පෙත්සම සමඟද එයම 'එක්ස්3' ලෙසට ලකුණු කොට ඉදිරිපත් කොට ඇත. යූ.එල්.කදුරුගමුව මහතාගේ දිවුරුම් පෙත්සම සමඟ යාකොට ඇති 'එක්ස්1' දරණ 28.06.95 දිනැති අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ සටහන්වල අංක 2 යටතේ සී.එල්.පෙරේරා මහතා සභාපති තනතුරෙන් ඉවත් කර ඇති බවට දක්වා ඇත. එමෙන්ම එහි අංක 9 යටතේ මෙම නඩුව පිළිබඳව එකඟ වූ තත්ත්වය දක්වා ඇත. එමගින් මෙම නඩුව සමතයකට පත් කර ගැනීමට අවධානය යොමු කොට එසේ සමතයකට පත් කර ගැනීම අනුමත කර ඇති අතරම ඊට පැමිණිලිකාර සමාගමේ මුද්‍රාව තැබීමට බලය පැවරීම පිළිබඳව යෝජනා සම්මුතියක් අනුමත කරගෙන ඇති බව පෙනේ. ඉහත සඳහන් කල 'එක්ස් 1' හි සඳහන් සටහන් පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය 23.02.96 දින පැවැත්වූ රැස්වීමේදී ස්ථිර කර ඇති අතර, එකී 23.2.96 දිනැති රැස්වීමේ සටහන්වල සහතික පිටපතක් ද 'එක්ස්2' ලෙසට ඉදිරිපත් කොට ඇත. එමෙන්ම කදුරුගමුව මහතාගේ දිවුරුම් පෙත්සම සමඟ ඉදිරිපත් කොට ඇති 'එක්ස්5' දරණ 25.10.96 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ සටහන් අනුව ද 28.06.95 වන දින පැවැති රැස්වීමේදී නීතිඥ එච්.අහමඩ් මහතාට දී තිබූ පෙරකලාසිය අවලංගු කිරීම සිදුකල බව ස්ථිර කර ඇති බව පෙනේ. එමෙන්ම නීතිපතිවරයාට පසු අවස්ථාවකදී දී තිබූ පෙරකලාසිය දීම සනාථ කල බවටත් දක්වා ඇත. 'එක්ස්1' දරණ 28.06.95 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ සටහන් වල අංක.9 යටතේ මෙම නඩුව සමථයකට පත් කිරීම අනුමත කර ඇති අතර, එසේ සමථයකට

ධ.....

පත්වීමට අදාල කොන්දේසි වල පලවන කොන්දේසියේ ඇත්තේ පැමිණිලිකාර සමාගම විසින් තීතිඥ එච්.අහමඩ් මහතාට දී තිබූ පෙරකලාසිය අවලංගු කිරීමට එකඟ වී ඇති බවය.

තවද 15322/එම්.ආර්.නඩුවේ එම සමථ කොන්දේසි ඉම්බාම් මහතාගේ දිවුරුම් පෙත්සම සමඟ 'එක්ස් 4' ලෙසට ඉදිරිපත් කර ඇත. 28.06.95 වන දින ඉහත පරිද්දෙන් වන පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමක් තිබීම ගැන "එක්ස් 1" හි දැක්වෙන සටහන් පිළිබඳව තීතිඥ අහමඩ් මහතා ඉදිරිපත් කර ඇති කරුණු වලින් හෝ පැමිණිලිකාර සමාගමේ සී.එල්.පෙරේරා මහතාගේ දිවුරුම් පෙත්සම මගින් දක්වා ඇති කරුණු වලින් හෝ හබ කර නැත. එමෙන්ම යූ.එල්.කදුරුගමුව මහතා ගේ දිවුරුම් පෙත්සම සමඟ ගොණු කර ඇති "එක්ස්4" දරණ 07.10.96 දිනැති ලේඛණය මගින් තීතිඥ එච්.අහමඩ් මහතා ඔහුට දී තිබූ පෙරකලාසිය අවලංගු කිරීමට කැමැත්ත දීමේ ලේඛණයට ඔහු අත්සන් යොදා දී ඇති බවත් පෙනී යයි.

ඉදිරිපත් වී ඇති කරුණු වලින් පෙනී යන්නේ 10.10.96 වන දින සී.එල්.පෙරේරා මහතා විසින් තීතිඥ එච්.අහමඩ් මහතා වෙත යවා ඇතැයි කියන ලේඛණය අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ තීරණවලට එරෙහිව යැවීමට ඔහුට කිසිම බලයක් නොතිබුන බවත් එකී දිවුරුම් පෙත්සමෙන් සනාථ වන බවයි. ඉහත තත්වයන් [illegible]ඩ 28.06.95 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ සටහන් බැලූ බැල්මට වලංගු යයි යන පදනම මත පියවර ගැනීමට අධිකරණයට සිදුවේ. එකී රැස්වීමේ සටහන්වල කෙලින්ම තීතිඥ අහමඩ් මහතාගේ පෙරකලාසිය අවලංගු කිරීමට යෝජනා සම්මුතියක් අනුමත කරගෙන ඇති බව පෙනී නොගියද

6....

ඒ දින පැහැදිලිවම මෙම නඩුව ඒ වන විට ඉදිරිපත්ව තිබූ ලිඛිත කොන්දේසි මත සමතයකට පත් කිරීමට එකඟ වී ඇති බවත් එකී කොන්දේසිවල 1 වන කොන්දේසිය මෙම නීතීඥ මහතා ගේ පත්වීම අවලංගු කිරීම බවට දැක්වේ.

සි.න.වි.ස.27(2) වගන්තියේ ප්‍රතිපාදන අනුව පෙනී යන්නේ 27(1) වගන්තියේ දැක්වෙන ආකාරයට නීතීඥ මහතෙකු පත් කිරීමෙන් පසුව එම පත්වීම අධිකරණයේ අවසරය ඇතිව සහ සේවා දායකයා විසින් අත්සන් කරනු ලැබ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලක් මගින් නීතීඥයාට දැනුම්දීමෙන් පසු ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන තුරු හෝ එකී දෙවෙනි උප වගන්තියේ දැක්වෙන අන් අවස්ථාවක් යටතේදී හෝ නඩුවේ සියලු කටයුතු අවසන් කිරීම සඳහා එම පත් කිරීම බලසහිත බවය.

ඉදිරිපත් වී ඇති කරුණු අනුව පෙනී යන්නේ පැමිණිලිකාර සමාගම විසින් අත්සන් කරනු ලැබ අධිකරණය වෙත බාරදී ඇති ලියවිල්ලක් මේ පෙරකලාසිය අවලංගු කිරීම සඳහා තිබී ඇති බවය. කෙසේ වෙතත් අදාල නීතීඥ මහතා විසින් ඔහුගේ 07.10.96 දිනැති පැමිණිලිකාර සමාගම අමතා ඇති ලිපිය මගින් ඔහුගේ පෙරකලාසිය අවලංගු කිරීම සඳහා නීතිපතිතුමාට ද පිටපතක් සහිතව කැමැත්ත දී ඇති බව පෙනේ. එම ලේඛනය ද දැන් අධිකරණය ඉදිරියේ ඇත. එම ලේඛණය 'එක්ස් 4' ලෙසට පැමිණිලිකරුගේ ලේකම්වරුන්ගේ අධ්‍යක්ෂකගේ 08.01.97 දිනැති පෙර සඳහන් දිවුරුම් පෙත්සම සමඟ ගොනු වී ඇත. එසේම ඉදිරිපත් වී ඇති කරුණු අනුව පෙනී යන්නේ පසු දිනයක දී නීතීඥ අහමඩ් මහතා පෙරකලාසිය අවලංගු කිරීමට එකී ලිපියෙන් දී ඇති කැමැත්ත ඉල්ලා අස් කර ගැනීමට ඉල්ලා ඇති බවය. එහෙත් එක් මතාවක් එපරිද්දෙන් දී

(....

ඇති කැමැත්තක් ඉල්ලා අයි කර ගැනීමට ඉඩදීම කල නොහැක. එවැනි ඉල්ලීමකට ඉඩ දීමට ප්‍රතිපාදන ද නැත. 28.06.95 වන දින තිබී ඇති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ගත් තීරණ මේ වන තෙක් අවලංගු කිරීමක් හා/හෝ බලරහිත වීමක් සිදුවී ඇති බවට තීතීඥ එච්.අහමඩ් මහතා විසින් ඉදිරිපත් කර ඇති කරුණු වලින් හෝ පැමිණිලිකාර සමාගම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති කරුණු වලින් හෙළිදරව් වන්නේ නැත. අධිකරණය ඉදිරියේ ඇති කරුණු වලින් ගත හැකි එකම නිගමනය වන්නේ එකී 28.06.95 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගෙන තිබූ තීරණ 23.02.96 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී සනාථ කර තිබීම පමණයි. එමෙන්ම 28.06.95 දින රැස්වීමේදී එහි සටහන් අංක 2 යටතේ සී.එල්.පෙරේරා මහතා පැමිණිලිකරුගේ සභාපති තනතුරෙන් ඉවත් කිරීම සඳහා යෝජනා සම්මුතියක් අනුමත කරගෙන තිබියදී නීතිඥ එච්.අහමඩ් මහතා ට 10.10.96 දිනැති ලිපිය ලියා ඇති බව පෙනේ. පැමිණිලිකාර සමාගම සඳහා පෙනී සිටීමට දී තිබූ පෙරකලාසිය තවමත් බලසහිත බව දන්වා ඇත්තේ එම ලිපියෙන්ය. එම ලිපිය ද ලියා ඇත්තේ 28.06.95 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලින් පසුව බව පෙනේ.

තත්ත්වය එසේ හෙයින් ඉදිරිපත් වී ඇති සියලු කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ සි.න.වි.ස 27(2) උප වගන්තියේ දැක්වෙන අභියාචනාවයන් පැමිණිලිකාර සමාගම විසින් නීතිඥ එච්.අහමඩ් මහතා ට දී තිබූ පෙරකලාසිය පිළිබඳව සපුරා ඇති බවය. පැමිණිලිකාර සමාගමේ ලේකම්වරුන්ගේ අධ්‍යක්ෂක සඳුරුගමුව මහතාගේ දිවුරුම් පෙත්සම සමග ගොනු කර ඇති 'එක්ස්ට්' අංක 24.7.96 දිනැති පැමිණිලිකරු විසින් ලේකම් ගෙන නීතිඥ අහමඩ් මහතා අමතා ඇති ලිපියෙන් මුලුව ආකාය කර තිබූ පෙරකලාසිය අවලංගු කිරීමට සමාගම ගෙන ඇති


තීරණය පිළිබඳව දන්වා ඇත. 11.11.96 දිනැති නීතිපති වෙනුවෙන් මෝසම ගොනු කර ඇති නීතිඥ පී.ඒ.ජේ.පීරිස් මහත්මියගේ මෝසම සමඟ පෙරකලාසිය විධිමත්ව ප්‍රකාශනය කිරීමේ ලියවිල්ල ද අධිකරණයට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පැමිණිලිකාර සමාගම විසින් නීතිඥ එම්.අහමඩ් මහතාට දානය කර ඇති පෙරකලාසිය අවලංගු කිරීමට අධිකරණයේ අවසරය දෙමි. පැමිණිලිකරු වෙනුවෙන් ගොනුවී ඇති, නීතිඥ පී.ඒ.කුමාරපේරු පීරිස් මහත්මියගේ පෙරකලාසිය භාර ගනිමි.

අත්/ක,....

(රෙජිස්ට්‍රාර් ...)

අති. දිසා විනිසුරු - කොළඹ.




(42) 99.5.21

(I) නිත්‍යව.

(II) නිත්‍යව ලැබී ඇත.

පැමි/වෙනුවෙන් නීතිඥ ඇස්ටර් මහත්මිය.

නඩු පෙර ඇති නැතැහොත් ........ ඇස්ටර් මිය හිමි.

21.5.99 දින රෙජිස්ට්‍රාර් ... නියෝගය

... අධි/ගේ නියමයි.

**Call - 2/6/99**

අත්/ක,....

අ.දි.